# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,039 - 2017 සැප්තැම්බර් මස 29 වැනි සිකුරාදා - 2017.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 864 |


*සැ. යු.* - ශ්‍රී ශාක්‍යසිංහාරාම විහාරස්ථ කාර්ය සාධක සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 සැප්තැම්බර් මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 ඔක්තෝබර් මස 20 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ඔක්තෝබර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


863- B 081211 — 353 (2017/09)
D 1 -

# විවිධ දැන්වීම්

## කොළඹ දී පැවැත්වෙන (වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන) බස්නාහිර පළාත් මහාධිකරණයේ දී ය

රත්මලාන, බොරුපන, ෆෙරී පාර, අංක 40 දරන ස්ථානයෙහි සහ දැනට ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 10, මාළිගාව පාර, රත්මලාන, ශ්‍රී ලංකාව හි පිහිටි ද ට්‍රේඩ්ස්මන් එස්. එල්. (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම සම්බන්ධයෙන් වන කාරණාවේ දී ය.

නඩු අංකය : HC/Civil/39/2017/CO
ස්වභාවය : ඈවර කිරීම්

*සහ*

2007 අංක 7 දරන සමාගම් පනතේ XII පරිච්ඡේදය යටතේ අධිකරණය විසින් ඈවර කිරීම සඳහා වූ කරනු ලබන ඉල්ලීමකි.

ශියාමෙන් සුපර් ලයිට් ලයිටින් කම්පැනි ලිමිටඩ්

No. 557, Xiahu She,
Houkeng,
Huli District,
Xiamen,
China. (361009)

තම ඇටර්නි බලකරු වන රාජා සෙලස්ටින් බ්රුනෝ ජෝශප් මහතා, අංක 21, විල්සන් වීදිය, කොළඹ 12, ශ්‍රී ලංකාව, මගින් පෙනී සිටී.

..................................................*පෙත්සම්කරු.*

කොළඹ දී පවත්වනු ලබන (සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) බස්නාහිර පළාත් මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් 2017 අගෝස්තු මස 10 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් කේ.පී.ලෝ. ඇසෝසියේට්ස් නීතිඥ සමාගම විසින් ඉදිරිපත් කර ඇති බව ද එකී පෙත්සම 2017 නොවැම්බර් මස 09 වැනි දින මෙම අධිකරණය ඉදිරියේ විභාග කිරීමට නියම කර ඇති බව ද එකී පෙත්සම මත නියෝගයක් කිරීම, තහවුරු කිරීමට හෝ ඊට විරුද්ධ වීමට හෝ කැමති එකී සමාගමේ කිසියම් ණය හිමියකු හෝ සහදායකයකු වේ නම් ඒ තැනැත්තාට තත් කාර්ය සඳහා එය විභාග කරන අවස්ථාවෙහි පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් හෝ පෙනී සිටිය හැකි බව ද පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියකුට හෝ සහදායකයකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. පී. ලෝ. ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරු,
218, අළුත්කඩේ වීදිය,
දෙවන මහල,
කොළඹ - 12.

*සටහන* :- එකී පෙත්සම විභාග කරන අවස්ථාවෙහි පෙනී සිටීමට කැමති ඕනෑම තැනැත්තකු විසින් තමා එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් කේ.පී.ලෝ. ඇසෝසියේට්ස් වෙත භාරදිය යුතුය නැතහොත් තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමෙහි එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එය එම තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔහුගේ හෝ ඔවුන්ගේ (නීතිඥවරයකු වෙතොත් එම) නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන් ම වර්ෂ 2017ක් වූ නොවැම්බර් මස 08 වැනි දින ප. ව. 6.00 පසුවීමට පෙර ලැබෙන ලෙස භාරදිය යුතු ය. නැතහොත් තැපෑලෙන් එවන්නේ නම් එදින එකී වේලාවට පෙර ලැබෙන ලෙස කල්වේලා ඇතිව දැනුම් දිය යුතු ය.

09-867

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.